# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2347/06- 2023 අගෝස්තු මස 29 වැනි අඟහරුවාදා - 2023.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 05/2023

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

*ආඥාව*

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, 2023 අගෝස්තු මස 30 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයේ 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හෝ ගෙවිය යුතු වන අවස්ථාවක නම්, එකී උපලේඛනයේ 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු නියම කර අය කළ යුතු බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| සං. ව. ශීර්ෂය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය (4) | සාමාන්‍ය (5) | |
| **11.01** | **1101.00** | | **තිරිඟු හෝ මෙස්ලින් පිටි** | | | |
| | 1101.00.10 | --- | තිරිඟු වලින් | (PK) නිදහස් | 20% හෝ කි. ග්‍රෑමයට රු. 27/- | කි. ග්‍රෑ. |

EOG 08 - 0295

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.